## හානිය

- කීටයින් ළූණු පත්‍ර කොපුව තුලට වී කොළ පැහැති කොටස් කා දමයි
- මෙම දළඹුවන් රාත්‍රී කාලයේ දී වඩාත් ක්‍රියාශීලී වේ




## පාලනය

- බිත්තර කැදලි සහිත ශාක කොටස් එකතු කර විනාශ කිරීම
- බෝග අවශේෂ පුළුස්සා දැමීම
- ධාරක ශාක විනාශ කිරීම
- රසායනික පාලනය
  - හානිය උග්‍ර ලෙස පවතින ප්‍රදේශවල පැල සිටුවන අවස්ථාවේදී කාබොෆියුරාන් 3% ජී 15-20 කි. ග්‍රෑම්/හෙක්
  - වැඩුනු වගාවන් සඳහා

| | |
|---|---|
| ක්ලෝෆ්ලුඑසියුරෝන් 5 ඊසී | 450 මිලි/හෙක් |
| ඩයසිනෝන් 50 ඊසී | 1400 මිලි/හෙක් |
| ඩෙල්ටාමෙත්‍රින් 25 ඊසී | 270 මිලි/හෙක් |
| සයිෆ්ලුත්‍රින් 5 ඊසී | 500 මිලි/හෙක් |
| එස්ෆෙන්වලරේට් 7.5 ඊසී | 125 මිලි/හෙක් |
| ඉමමෙක්ටින් බෙන්සොඒට් 5% එස්ජී | 160 ග්‍රෑම්/හෙක් |
| මෙටාෆ්ලුමිසෝන් 24 ඊසී | 1000 මිලි/හෙක් |

## මුල් කන කුහුඹුවන්

*(Dorylus orientalis)*



- වේයන්ට වඩා තරමක් විශාලය
- රතු පැහැතිය

## හානිය

- පසේ ජීවත් වෙමින් ළූණු බල්බ ආහාරයට ගනී
- හානි කල බල්බ පසුව කුණු වේ
- හානිවූ පැල වල පත්‍ර මැල වී කහ පාට වේ

## පාලනය

- පස පෙරලීම සිදු කර සූර්යාලෝකයට නිරාවරණය කිරීම
- රසායනික පාලනය

| | |
|---|---|
| ඩයසිනොන් 50 ඊසී | 115 මි.ලී./100 ව.මී. |
| ක්ලෝරොපයිරිපොස් 20 ඊසී | 30 මි.ලී./100 ව.මී. |
| කාබරිල් 85% කුඩු | 150 ග්‍රෑම්/100 ව.මී. |

විමසීම් : අධ්‍යක්ෂ, ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම
දුරකථන : 025-2249177/025-2249132



Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya   Printed by: AGRICULTURE PRESS, Gannoruwa

අපි වවමු - රට නඟමු

දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007-2010

# ලොකු ළූණු වගාවට හානිකරන පළිබෝධ




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

# ලොකු ළූණු වගාවේ පලිබෝධ

- පැල මැක්කන්
- පත්‍ර හා මල් කන දළඹුවන්
- මුල් කන කුහුඹුවන්

## පැල මැක්කා (*Thrips tabaci*)



- කහ පැහැයට හුරු දුඹුරු පැහැතිය
- මි. මී. 1 ක් පමණ වූ සිහින් දිගටි කෘමීන්ය

## හානිය



- මෙම සතුන් ළූණු පත්‍රයේ අපිචර්මය සූරා යුෂ උරා බොයි. එවිට පත්‍රය මත ඇති වන සුදු පැහැති සීරීම් ලකුණුවලින් හානිය හඳුනා ගත හැක
- හානිය වඩාත් උග්‍ර වූ විට පත්‍ර ඇඹරී වියලී යයි

- හානියට පාත්‍ර වූ වගාවන්හි බල්බ කුඩා වී අස්වනු අඩුවේ
- මල් වගාවට හානි කිරීම නිසා බීජ අස්වැන්න අඩුවන අතර බීජවල පැලවීමේ හැකියාවද අඩුවේ
- අධික වියලි කාලගුණයක් පවතින ජූලි - අගෝස්තු මාසවලදී පැලමැක්කාගේ හානිය වැඩිය. අධික උෂ්ණත්වය හා අධික සුළං තත්ත්ව මීට හේතු වී ඇත

## හානිය පාලනය

- වගාව නියමිත කලට ආරම්භ කිරීම
- නිවැරදි තවාන් පාලන ක්‍රම භාවිතය
- විසිරුම් ජල සම්පාදන ක්‍රම භාවිතය
- ක්ෂේත්‍රයේ ඇති විකල්ප ධාරක ශාක විනාශ කිරීම
- යූරියා පොහොර විශාල වශයෙන් වගාවට නොයොදා නිර්දේශිත පොහොර භාවිතා කිරීම
- රසායනික පාලනය

| | |
|---|---|
| තයක්ලොප්‍රිඩ් 24 එස් සී | 400 මිලි/හෙක් |
| ඉමිඩක්ලොප්‍රිඩ් 20 එස් එල් | 300 මිලි/හෙක් |
| ෆිප්රොනිල් 5 එස් සී | 500 මිලි/හෙක් |
| ප්‍රොෆියොෆොස් 50 ඊසී | 1000 මිලි/හෙක් |

දින 7 - 10 කාලාන්තරවලින් මෙම කෘමිනාශක මාරුවෙන් මාරුවට යෙදීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිය.

## පත්‍ර හා මල් කන දළඹුවන්

ලොකු ළූණු වගාවට හානි සිදු කරන *Spodoptera litura* හා *Spodoptera exigua* නමින් හැඳින්වෙන දළඹු විශේෂ දෙකක් දැකිය හැකිය.

## *Spodoptera litura*

- සුහුඹුලා මධ්‍යම ප්‍රමාණයේ සලබයෙකි. ඉදිරි පියාපත්වල දුඹුරු ලප සහිතය. අපර පියාපත් සුදු පාටය
- කීටයා අඳුරු අළු හෝ කොළ පැහැයට හුරු කළු පාටය. ශරීරයේ ඉදිරිපස කළු පැහැති පටියක් ඇත. සම්පූර්ණයෙන් වැඩුණු කීටයා මි. මී. 40 - 50 ක් දිගය
- පිලා අවධිය පසෙහි ගත කරයි



සුහුඹුලා



කීටයින්

## *Spodoptera exigua*

- සුහුඹුලා දුඹුරු පැහැති සලබයෙකි. අළුවන් දුඹුරු පැහැ පූර්ව පියාපත්වලින් හා දිළිසෙන සුළු අපර පියාපත්වලින් සමන්විතය
- කීටයා අඳුරු කොළ පාටය
- මි.මී. 37 - 50 දිගය
- පිලා අවධිය පසෙහි ගත කරයි



සුහුඹුලා



කීටයා